ඔහු අධ්‍යාර වතුලේඛ අංක:අ/ 24 සිට 36

කුඩා හේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 349, ගාල්ල පාර,
කොළඹ 03.
1989.-.09.-.18...දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත,

මාතෘකාව | විගා සහනාධාර කාර්යාල කටයුතු භූගෝලීය ප්‍රදේශ අනුව ප්‍රතිසංවිධානය කිරීම

1.0 **පරමාර්ථය:**

අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයන්හි හේ වගා සහනාධාර කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබන්නේ නැවත වගා, අලුත් වගා සහ පළු සැපයීම සඳහා කටයුතු කරන අංශ තුනක් මගිනි. මෙම ක්‍රමය මගින් පහත සඳහන් ගැටළු ඇතිවන බව දැනටමත් ඔප්පුවී ඇත.

1. එකම ඉඩමට සහනාධාර ක්‍රම දෙකක් හෝ තුනක් ඉල්ලුම් කරන විට විවිධ අවස්ථාවලදී පරීක්ෂක නිලධාරී වෙත යොමු කිරීම.
2. එකම ඉඩමේ පරීක්ෂණ කීපයක් කිරීම නිසා අධිකාරියේ පරිපාලන ව්‍යයදම් වැඩිවීම.
3. එකම වගා කන්නයක් තුළදී ඉල්ලුම්කරුට සිය ඉඩමේ වගා කටයුතු සියල්ල සැලසුම් කර ගැනීමට බාධා ඇතිවීම.

මෙම ගැටළු මඟ හරවා ගැනීම පිණිස ප්‍රාදේශීය කාර්යාලයන්හි වගා සහනාධාර අංශවලට විෂයය බෙදීමේ ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම මෙම වතුලේඛයේ පරමාර්ථය වන අතර, ඒ අනුව එක් එක් පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශයකට අදාළ සියලුම කෙෂේත්‍ර කටයුතු පිළිබඳ එකම අංශයකින් ක්‍රියාත්මක කිරීම අරමුණ වේ.

2.0 **ක්‍රියා මාර්ගය:**

2.1 ප්‍රාදේශීය කාර්යාලයන්හි වගා සහනාධාර අංශවලට අනුයුක්ත සියලුම මාණ්ඩලික නිලධාරීන් සහ ලිපිකරුවන්ට අයත් විෂයය බෙදීම් මින් ඉදිරියට එක් එක් සහනාධාර ක්‍රමය පදනම් නොකොට භූගෝලීය ප්‍රදේශ අනුව හේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ හෝ පරිපාලන දිස්ත්‍රික්ක හෝ ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ වශයෙන් බෙදිය යුතුය. මෙහිදී දැනට වගා සහනාධාර අංශයට/අංශවලට අනුයුක්ත ලිපිකරුවන් සංඛ්‍යාවම මෙම විෂයය බෙදීම සඳහාද උපයෝගී කරගත යුතු අතර, එම බෙදීම් අනුවම විෂය භාර මාණ්ඩලික නිලධාරී සහ අංශ ප්‍රධානීන් අතරේද විෂයය බෙදීම් ඇතිවිය යුතුය.

මෙම ක්‍රමය අනුව එක් විෂයය ලිපිකරුවකු, එම අංශ ප්‍රධානී සහ අංශය භාර මාණ්ඩලික නිලධාරී තැන තීසින් සිය රාජකාරී ප්‍රදේශයට ගැනෙන ඉඩම්වල නැවත වගා, අලුත් වගා පළු සැපයීම යන ආධාර ක්‍රම තුන යම්බන්ධයෙන්ම කටයුතු කළ යුතුය.

2.2. ඔබ කාර්යාලයේ වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රතිසංවිධානය සිදුකොට එක් එක් අදාළ වගා සහනාධාර කටයුතු කරනු ලබන ලිපිකරු/අංශ ප්‍රධානී/මාණ්ඩලික නිලධාරී ප වාර්තාවක් සති දෙකක් ඇතුළත මා වෙත එවිය යුතුය.

ආචාර්ය සරත් බී.එතන්
සභාපති.

ප්‍රතිය:-1. සාමාන්‍යාධිකාරී - කුඩා හේ වතු සංවර්ධන අධිකාරිය.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන)
3. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)